
# 8 සීනයි ගිවිසුම



8.1 රූපය - මෝසෙස් තුමා දස පනත සමග

පාර්ශවයන් දෙකක් අතර යම් කරුණක් මුල්කර ගනිමින් කොන්දේසි සහිත ව ඇති කර ගන්නාවූ එකඟතාවක් ගිවිසුමක් යනුවෙන් හැඳින්වේ. එවැනි ගිවිසුම් විවිධාකාර ය. දේශපාලන ගිවිසුම්, ආර්ථික ගිවිසුම්, සාම ගිවිසුම්, විවාහ ගිවිසුම් යනාදිය උදාහරණ ලෙස දැක්විය හැකි ය.

ශුද්ධ බයිබලය තුළ ද ගිවිසුම් දක්නට ඇත. එම ගිවිසුම් සාමාන්‍ය සමාජය තුළ දක්නට ලැබෙන ගිවිසුම්වලට වඩා බෙහෙවින් වෙනස් ය. එවැනි වෙනස්කම් කිහිපයක් මෙසේ ය:

- ගිවිසුමට මුලපුරන්නේ දෙවියන් වහන්සේ ය.
- එහෙත් දෙවියන් වහන්සේ හා මිනිසා අතර අසීමිත පරතරයක් ඇත.
- දෙවියන් වහන්සේ එම ගිවිසුම් පොරොන්දුවලට පක්ෂපාත වුව ද මිනිසා එම පොරොන්දු බොහෝ විට කඩ කරයි.

එවැනි ගිවිසුම්වලට උදාහරණ කිහිපයකි. එනම්;

(1) **දෙවියන් වහන්සේ ආදිමව්පියන් සමග ඇති කරගත් ගිවිසුම**

> තා සහ ස්ත්‍රිය අතර ද, තගේ වංශය හා ඇගේ වංශය අතර ද, බද්ධ වෛරය තබන්නෙමි. ඔහු තගේ හිස පොඩි කරන්නේ ය. තෝ ද ඔහුගේ විලුඹ දෂ්ට කරන්නෙහි ය.
> (උත්පත්ති 3:15)

දෙවියන් වහන්සේ ආදිමව්පියන් සමග ගිවිසුමක් ඇති කර ගැනීමට පසුබිම වූයේ, ආදිමව්පියන් දේව හඬට පිටුපා අකීකරු වීම යි. එම නිසා ඔවුහු දේව සබඳතාව අහිමි කර ගත්තෝ ය. අහිමි කරගත් දේව සබඳතාව යළි ස්ථාපිත කිරීමට ගැලවුම්කරුවකු එවීමට දෙවියන් වහන්සේ ආදිමව්පියන්ට පොරොන්දු වූ සේක. එම පොරොන්දුව ක්‍රිස්තුන් වහන්සේ තුළ සඵල වූ සේක. උන්වහන්සේ පාපය සංකේතවත් කරන සර්පයාගේ හිස පොඩි කළ සේක.

**(2) දෙවියන් වහන්සේ නෝවා සමග ඇති කරගත් ගිවිසුම**

ආදිමව්පියන්ගේ අකීකරුකමින් පාපයට නැඹුරු වූ මිනිසාගේ පාපී බව ක්‍රමක්‍රමයෙන් වර්ධනය විය. එබැවින් ජලගැල්මකින් පාපය මෙලොවින් තුරන් කිරීමට දෙවියන් වහන්සේ කටයුතු කළ සේක. දෙවියන් වහන්සේ ජලගැල්මකින් නැවත පොළෝ තලය විනාශ නොකරන බවට ගිවිසුමකින් පොරොන්දු වූ සේකඃ

> නුඹලා සමග පිහිටුවන ලද ගිවිසුම වනාහි මින් පසු කවදාවත් ජලගැල්මකින් සියලු ජීවමාන සතුන් විනාශ කරනු නොලබන බවත්, මින් පසු කවදාවත් ජල ගැල්මකින් මහ පොළොව වනසනු නොලබන බවත් ය.
>
> (උත්පත්ති 9:11)

එම ගිවිසුමේ බාහිර සලකුණ දේදුන්න යිඃ

> වලාකුළුවල මම මාගේ දේදුන්න තබමිඃ මා හා ලෝකයා අතර පිහිටුවන ලද ගිවිසුම් ලකුණ එය වන්නේ ය.
>
> (උත්පත්ති 9:13)

**(3) දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කරගත් ගිවිසුම**

දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමග ද ගිවිසුමක් ඇති කරගත් සේක. මෙම ගිවිසුම ආකාර දෙකකින් (සම්ප්‍රදයයන් දෙකකින්) ඉදිරිපත් කර ඇතඃ



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

| උත්පත්ති 15:1-21 (J සම්ප්‍රදය) | උත්පත්ති 17:1-14 (P සම්ප්‍රදය) |
|---|---|
| 1. "සමිඳාණන් වහන්සේද, ඔහු පිටතට රැගෙන ගොස්, අහස දෙස බලා, හැකි නම් ඔය තාරකා ගණන් කරන්න. නුඹේ දරු පරපුර එසේ ම වන්නේ ය." (උත්පත්ති 15:5)<br>2. මේ දේශය නුඹේ පෙළපතට මම දෙමි. (උත්පත්ති 15:21) | 1. "මම නුඹට බොහෝ දරු සම්පත් දෙමි නුඹෙන් ජාතීන් උපදවන්නෙමි. නුඹෙන් රජවරු පහළ වන්නාහ." (උත්පත්ති 17:6)<br>2. "නුඹ දැන් ආගන්තුක ව වසන මේ දේශය, මේ මුළු කානාන් දේශය නුඹට ද, නුඹෙන් පසු පැවතෙන නුඹේ පෙළපතට ද මම සදහට ම අයිති කොට දෙමි." (උත්පත්ති 17:8) |

මෙම ගිවිසුමේ ප්‍රධාන කරුණු දෙකක් අඩංගු වේ. එනම්;

1. අසංඛ්‍ය වූ දරු පරපුරක් ලබා දීම
2. සදහට ම හිමිවන දේශයක් ලබා දීම

දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කර ගන්නා ලද ගිවිසුමේ බාහිර සලකුණ චර්මඡේදනය යි.

> මාගේ ගිවිසුම නම් මේය. එනම්, නුඹලාගේ පිරිමි දරුවන් චර්මඡේදනය කළ යුතු ය.
> (උත්පත්ති 17:10)

මෙම බාහිර පිළිවෙත ඉටු කිරීම මගින් ඉශ්‍රායෙල් ජනතාව උන්වහන්සේ සමග ගිවිසුම් සබඳතාවකට ඇතුළු වූහ.

### (4) සීනයි ගිවිසුම

සාමාන්‍ය එඬේරික ජීවිතයක් ගත කළ ඉශ්‍රායෙල් ජනතාව සුවිශේෂී දේව ජනතාවක් බවට පත්වන්නේ සීනයි ගිවිසුම මගිනි. මෙම ගිවිසුමට එකඟ ව ජීවත් වීම සඳහා දුන් නීති පද්ධතිය දස පනත යි. මෙම නීති පද්ධතිය දේව ආදරයේ විශේෂ සලකුණකි. දෙවි සමිඳුන් හා අසල්වැසියා සමග අප සබඳතා පවත්වා ගත යුතු ආකාරය මෙමගින් අපට පැහැදිලි කරයි. මෙම ගිවිසුම දෙවි සමිඳුන්ට සහ අසල්වැසියාට අප ව සමීප කරවයි.

නික්මයාම 20:1-17

දෙවියන් වහන්සේ වෙත අපගේ යුතුකම්


1. මා හැර අන් කිසි ම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතු ය.
2. නුඹ දෙවි සමිඳාණන් වහන්සේගේ නාමය අගරු ලෙස භාවිත නොකරව.
3. සබත් දින ශුද්ධ ලෙස ගත කිරීමට සිතට ගන්න.

අසල්වැසියා වෙත අපගේ යුතුකම්

4. නුඹේ පියාට ද මවට ද ගෞරව කරව.
5. මිනී නොමරව.
6. කාමමිථ්‍යාචාරය නොකරව.
7. සොරකම් නොකරව.
8. නුඹේ අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නොකියව.
9. නුඹේ අසල්වැසියාගේ භාර්යාවට ඇළුම් නොකරව.
10. නුඹේ අසල්වැසියා සතු වෙනත් කිසිවකට හෝ ඇළුම් නොකරව.

දස පනත සර්ව කාලීන නීති පද්ධතියකි. එනම්, සෑම පරම්පරාවක ම ජනතාව එය පිළිපැද දේව සබඳතාව ගොඩනගා ගෙන ඇත. අපි ද එය අනුසාර කරමු. අනාගත පරම්පරාවන් ද එය පිළිපදිනු ඇත. ඒ අනුව සියලු පරම්පරාවෝ දස පනත අනුව ජීවත් වී සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරති; දේව රාජ්‍යයට ඇතුළු වීමට සුදුසුකම් ලබති. අපි ද එලෙස කර සදතන ජීවිතයට පංගුකාර විය යුතු වෙමු.

ඉශ්‍රායෙල් ජනතාව සීනයි ගිවිසුම මගින් දේව ජනතාවක් වූවා සේ ම අපි ද ප්‍රසාද ස්නාපනය තුළින් දේව දරුවන් වූයෙමු. ප්‍රසාද ස්නාපනය මගින් දෙවියන් වහන්සේ අප සමග ද ගිවිසුමක් ඇති කර ගන්නා සේක.



අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ පොරොන්දුවලට විශ්වාසවන්ත වන්නා සේ ම උන්වහන්සේගේ දරුවෝ වන අපි ද උන්වහන්සේට දුන් පොරොන්දු ඉටු කළ යුතු වෙමු. අප දෙවියන් වහන්සේට දුන් පොරොන්දු පමණක් නොව, අසල්වැසියාට ද වන පොරොන්දු ඉටු කරමින් විශ්වාසවන්ත පුද්ගලයින් විය යුතු ය. එමගින් අපගේ ස්වර්ගීය පියාණන් වහන්සේ මහිමයට පත් වන සේක.

**ක්‍රියාකාරකම**

1. පහත වගුව සම්පූර්ණ කරන්න.

| අනු අංක | ගිවිසුම | ගිවිසුම ඇති කර ගැනීමට හේතුව | ගිවිසුමේ පොරොන්දු |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |

2. "දස පනත සර්ව කාලීන ය" මෙම කියමන පැහැදිලි කරන්න. (වචන 75කට නොඅඩු)
3. ඔබ ප්‍රසාද ස්නාපන පොරොන්දු විශ්වාසවන්ත ව ඉටු කරන ආකාරය කරුණු **පහකින්** ලියා දක්වන්න.



**ජීවිතයට බිඳක්**

- බෞතීස්ම පොරොන්දු තුළ ජීවත් වෙමු.
- දස පනතට කීකරු වෙමු.
- සදාචාර සම්පන්න ව ජීවත් වෙමු.
- පොරොන්දු ඉටු කරමු.